# විශ්වවිද්‍යාල සිසුන් ක්‍රීඩා කටයුතු කෙරෙහි යොමු වීමේ ප්‍රවණතාව

ඩබ්. එච්. එස් .එල්. ප්‍රියදර්ශන[1]

**සංක්ෂේපය**

තරඟකාරි අධ්‍යාපන ක්‍රමය යටතේ සිසුන් බොහොමයක් ක්‍රීඩා කෙරෙහි යොමුවීම අඩුවන විට තරමක් මන්දගාමි ස්වරූපයක් ගෙන තිබේ. එහෙයින් විශ්වවිද්‍යාල සිසුන් ක්‍රීඩා කෙරෙහි යොමු නොවීම සඳහා බලපෑම් කරන හේතුන් හඳුනා ගැනීම මෙහි පර්යේෂණ අරමුණ විය.අධ්‍යයනය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයෙහි දෙවන වසර කලා පීඨයේ 100ක ගෙන් යුත් නියැදියක් තෝරාගන්නා ලදි. ප්‍රශ්නාවලි ක්‍රමය භාවිතයෙන් ප්‍රාථමික දත්ත රැස් කරගන්නා ලදී. අධ්‍යයන තුලින් අනාවරණය වූ කරුණු අනුව නියැදියෙන් 56% ක් ක්‍රීඩා කටයුතු සඳහා යොමුවේ.44% ක් ක්‍රීඩා කටයුතු කෙරෙහි යොමු නොවන අතර ඉන් 32% ක් ගැහැණු ළමුන් වන අතර 12% ක් පිරිමි ළමුන් වේ. මෙමගින් අනාවරණය වූ කරුණක් වන්නේ, මෙම ක්‍රීඩා සඳහා යොමු නොවන පිරිස් බොහොමයක් තම පාසල් අධ්‍යාපනය ලබන කාලය තුල පවා ක්‍රීඩාවලට වැඩි රුචිකත්වයක් නොදක්වා ඇති බවයි. කෙසේ වෙතත් ක්‍රීඩා සඳහා යොමු වී ඇති කීපදෙනකු පාසල් අවධිය තුල ක්‍රීඩා නොකල පිරිස් විය . විශ්වවිද්‍යාලය තුළ ක්‍රීඩා කටයුතු කෙරෙහි යොමු නොවීමට හේතු  ලෙස ඉදිරිපත් වූයේ පාසල් අවදියේදීවත් ක්‍රීඩා නොකළ හෙයින් ක්‍රීඩා වල යෙදීමට ඔවුන්ට නොහැකි වේ යන අවිශ්වාසයයි. එසේම දේශන වාරගණන අසීමිතව පැවතීම තවත් ප්‍රධාන හේතුවක් විය. ක්‍රීඩා කණ්ඩායම්වල ජ්‍යෙෂ්ඨයන්ගෙන් ඔවුන්ට සිදුවන තාඩන පීඩන නිසා ද ක්‍රීඩා කටයුතුවලට යොමු වූවන් එයින් ඉවත් වී ඇත. තව සමහරක් කාලය මනාව කළමනාකරණය කරගැනීමේ නොහැකියාව මත ක්‍රීඩාව කෙරෙහි යොමු වී නැත. කෙසේ වෙතත් ක්‍රීඩාවේ ඇති වැදගත්කම අවබෝධ කරගනිමින් ඉදිරි අනාගතයේ යම් හෝ පැතිකඩක් සාර්ථක කරගැනීමට ක්‍රීඩාව මහඟු පිටිවහලක් වේ යන අරමුණ ඇතිව බොහොමයක් දෙනා ක්‍රීඩා කටයුතුවලට යෙදෙන බව හඳුනාගත හැකිය. අධ්‍යාපනයට පමණක් සීමා නොවී ක්‍රීඩා කටයුතු කෙරෙහිද යොමු වීම තුළින් තමන් ලඟා වීමට බලාපොරොත්තු වන ඉලක්ක කෙරෙහි පහසුවෙන් ලඟා වීමට අවශ්‍ය පසුබිම මේ හරහා නිර්මාණය කරගත හැකි බව මෙමගින් නිගමනය කල හැකිය.

**මුඛ්‍ය පද :** විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයන්, ක්‍රීඩා, දේශන

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, whsudeera@gmail.com